පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 10 |

# තෙවන වාර පරීක්ෂණය 2023

## විෂයය : පුරවැසි අධ්‍යාපනය 1,11

පාසලේ නම : ..........................................................................................................

ඇතුළත්වීමේ අංකය : ...............................

කාලය : පැය තුනයි

### 1 කොටස

සැළකිය යුතුයි
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 - 40 තෙක් ප්‍රශ්නවලදී ඇති 1,2,3,4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ x ලකුණ යොදන්න.

01. "ප්‍රජාතන්ත්‍රවාදය යනු සියලු දෙනාට ම අයිතිවාසිකම් හිමිවන පාලන ක්‍රමයකි." මෙම ප්‍රකාශය කරන ලද්දේ ,
(1) මහාචාර්ය ගානර් ය. (2) සීලර් ය. (3) ඇරිස්ටෝටල් ය. (4) ඒබ්‍රහම් ලින්කන් ය.

02. ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යක ජනතාව සතු බලය හැඳින්වෙන්නේ,
(1) සර්වජන ඡන්ද බලය ලෙසිනි. (2) නීතියේ ආධිපත්‍ය ලෙසිනි.
(3) පරමාධිපත්‍ය ලෙසිනි. (4) ව්‍යවස්ථානුකූල බලය ලෙසිනි.

03. ඍජු ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේදී මතුවන ගැටළුවක් වන්නේ,
(1) ඡන්ද පැවැත්වීමට මුදල් නොමැතිවීම ය. (2) විවිධ පක්ෂ පැවතීම ය.
(3) නියමිත කාලයට මැතිවරණ පැවැත්වීම ය. (4) රාජ්‍යයක භූමිය විශාල වීම ය.

04. ඒක පක්ෂ ක්‍රමය ක්‍රියාත්මක වන රටක් වන්නේ මින් කුමක්ද ?
(1) චීනය. (2) ඇමරිකාව. (3) ඉන්දියාව. (4) ජපානය.

05. ජාතික රාජ්‍ය පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ ,
(1) 15 වන සියවසෙන් පසු යුරෝපයේ ආරම්භවී ඇත. (2) වැඩවසම් ක්‍රමයේ වර්ධනය සමග බිහිවිය .
(3) සමාජයට පෙර බිහිවී ඇත. (4) සෑම රාජ්‍යයක්ම ඒකාකාරී ස්වරූපයක් ගනී.

06. මධ්‍යම හා ප්‍රාන්ත වශයෙන් බලය මෙහෙයවන බල මධ්‍යස්ථාන දෙකක් දක්නට ඇති පාලන ක්‍රමය වන්නේ,
(1) ජනාධිපති (2) පාර්ලිමේන්තු. (3) සන්ධීය . (4) ඒකීය

07. මධ්‍යම ආණ්ඩුව සතු පරිපාලන බලතල යම් ප්‍රමාණයක් ප්‍රාදේශීය පාලන ඒකක වෙත පවරාදීම,
(1) බලය මධ්‍යගත කිරීම ලෙස හැඳින්වේ . (2) බලය විමධ්‍යගත කිරීම ලෙස හැඳින්වේ .
(3) බලය සංවරණය ලෙස හැඳින්වේ . (4) බලය බෙදාහැරීම ලෙස හැඳින්වේ

08. බහු සංස්කෘතික සමාජයක ජනතාව එක්සත්ව කටයුතු කිරීමෙන් ,
(1) ගැටුම් උත්සන්න වේ . (2) අන්‍යෝන්‍ය සුහදත්වය වර්ධනය නොවේ.
(3) මිනිස් නිදහස සීමා වේ . (4) ජාතික සමගිය හා සහජීවනය වර්ධනය වේ.

09. යහපාලනයක දැකිය හැකි මූලික ගුණාංගයකි,
(1) සමාජ මාධ්‍ය තහනම් කිරීම . (2) විනිවිද භාවයකින් කටයුතු කිරීම.
(3) ජනමාධ්‍ය වාරණය කිරීම . (4) දූෂණයෙන් හා වංචාවෙන් යුත් රාජ්‍ය පාලනය.

10. පාරිභෝගික භාණ්ඩයකට උදාහරණයක් වන්නේ,
(1) ඖෂධ (2) පොහොර (3) වාහන (4) දැව

11. නිෂ්පාදනය සඳහා මිනිසා විසින් යොදවනු ලබන මෙවලම් හා උපකරණ,
(1) ප්‍රාග්ධනය වේ. (2) ව්‍යවසායකත්වය වේ. (3) යන්ත්‍ර සූත්‍ර වේ. (4) අමුද්‍රව්‍ය වේ.

12. නිෂ්පාදනය සඳහා යොදාගන්නා ප්‍රධාන ශිල්ප ක්‍රම දෙක වන්නේ,
(1) ප්‍රාග්ධන සූක්ෂම හා පාරිභෝජ්‍ය සූක්ෂම (2) ශ්‍රම සූක්ෂම හා පාරිභෝජ්‍ය සූක්ෂම
(3) ප්‍රාග්ධන සූක්ෂම හා ශ්‍රම සූක්ෂම (4) තාක්ෂණික සූක්ෂම හා ප්‍රාග්ධන සූක්ෂම

13. නව ලිබරල්වාදී වෙළඳපල ආර්ථිකයක දැකිය හැකි මූලික ලක්ෂණයක් වන්නේ,
(1) රාජ්‍ය ව්‍යවසායන් වර්ධනය කිරීම. (2) රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලීකරණය කිරීම.
(3) ආර්ථිකයට රාජ්‍ය අංශයේ මැදිහත්වීම වැඩිකිරීම. (4) මිල පාලනයට රජය මැදිහත්වීම.

14. නිෂ්පාදනයේදී ව්‍යවසායකයාට ලැබෙන්නේ,
(1) පොලිය (2) වැටුප් (3) බදු කුලිය (4) ලාභ

15. ගෝලීයකරණය නිසා ශ්‍රී ලංකාව මුහුණ දී ඇති ධනාත්මක බලපෑමක් වන්නේ,
(1) උගතුන් රට හැර යාමයි. (2) දේශීය කර්මාන්ත අභාවයට යාමයි.
(3) සංවර්ධිත රටවලින් වන බලපෑම වැඩිවීමයි. (4) කාර්මික හා සේවා අංශවල ප්‍රගතියක් ඇතිවීමයි.

16. පවුල් අතර ඇතිවන ගැටුම් හැඳින්විය හැකි වන්නේ,
(1) අන්තර් ජාතික ගැටුම් ලෙසය. (2) සාර්ව ගැටුම් ලෙසය.
(3) සූක්ෂම ගැටුම් ලෙසය. (4) දේශපාලන ගැටුම් ලෙසය.

17. "ජය ජය " විසඳුම් ලබාදිය හැකි ගැටුම් නිරාකරණ ක්‍රමවේදය වන්නේ,
(1) මැදිහත්කරණය (2) උපදේශනය (3) විනිසීම (4) බේරම්කිරීම

18. අන්තර්ජාතික ගැටුම් ප්‍රධාන කොටස් දෙකකි.එම දෙක දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) වාර්ගික හා මතවාදී ගැටුම් (2) මතවාදී හා යුධමය ගැටම්
(3) යුධමය හා ආගමික ගැටුම් (4) වාර්ගික හා ආගමික ගැටුම්

19. ගැටුම් නිරාකරණය කරගැනීම සඳහා පුරවැසියන් තුළ පැවතිය යුතු ගුණාංගයක් වන්නේ,
(1) සංවේදී බව (2) ජීවිතහානි වැළකීම (3) ආත්ම ගෞරවය සුරැකීම (4) දේපළහානි වැළකීම

20. ගැටුම් ඇතිවීමට බලපාන ප්‍රධාන මූලයක් වන්නේ,
(1) මානසික තත්ත්වයන්ය. (2) අවහිරතා ඇතිවීමයි.
(3) පරමාර්ථ ඉටු නොවීමයි. (4) ආගමික මතවාදයි.

21. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය සාර්ථක වීමට බලපාන සාධකයක් වන්නේ,
(1) පාලකයාගේ සෑම ක්‍රියාවක්ම ජනතාව විසින් අනුමත කිරීමයි.
(2) ජනතාවට සහනාධාර උපරිමයෙන් ලබාදීමයි.
(3) දේශපාලන අවබෝධයකින් යුත් ජනතාවක් සිටීමයි.
(4) පාලකයින් ඉතා හොඳ ජීවන තත්ත්වයක් ගතකිරීමයි.

22. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ජීවත්වන පුරවැසියෙකු විසින් ඉටුකළයුතු සදාචාරාත්මක යුතුකමක් වන්නේ,
(1) පවතින නීතියට ගරු කිරීමයි. (2) වැඩිහිටියන්ට ගරු කිරීමයි.
(3) රජයට නියමිත බදු ගෙවීමයි. (4) අධිකරණයට ගරු කිරීමයි.

23. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ජනමාධ්‍ය විසින් ඉටුකළයුතු කාර්යයක් නොවන්නේ,
(1) ජනතාවගේ දැනුම වර්ධනය කිරීම. (2) දේශපාලන පක්ෂ ප්‍රවර්ධනය කිරීම
(3) ජනතාවගේ සතුට වින්දනය ඇති කිරීම. (4) සත්‍ය හා නිවැරදි තොරතුරු ලබාදීම.

24. ශ්‍රී ලංකාවේ බලය බෙදාහැරීම හා විමධ්‍යගතකිරීම සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1) පාලනයේ පහසුව පිණිස සිදුකරයි. (2) නිදහසින් පසු උනන්දුවී ඇත.
(3) පළාත් සභා ක්‍රමය පමණක් භාවිතා කරයි. (4) ඉංග්‍රීසි පාලකයින් පළාත් සභා ක්‍රමය හඳුන්වාදෙන ලදී.

25. නූතන බහු සංස්කෘතික සමාජවල දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණයක් වන්නේ,
(1) ජාතීන් අතර ගැටුම් නිර්මාණය වීමයි. (2) දේශපාලන මතවාද මත වෙන්වීමයි.
(3) ආගමික මතවාද මත ගැටුම් නිර්මාණය වීමයි. (4) සංස්කෘතික සම්මිශ්‍රණය වේගවත් වීමයි.

26. ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රමයට අදාළ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) 1977 න් පසු විවෘත ආර්ථික ක්‍රමය දක්නට ලැබේ. (2) 1977 ට පෙර විවෘත ආර්ථික ක්‍රමය දක්නට ලැබුණි.
(3) 1977 න් පසු රාජ්‍ය ව්‍යවසාය වර්ධනය විය. (4) 1977 ට පෙර පෞද්ගලික ව්‍යවසාය වර්ධනය විය.

27. ගෝලීයකරණය නිසා ලෝක ආර්ථිකය තුළ දක්නට ලැබෙන ලක්ෂණයක් වන්නේ,
(1) බහුජාතික සමාගම් දුර්වල වීම. (2) ආවෘත ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වාදීම.
(3) විවිධ කලාපීය සංවිධාන බිහිවීම. (4) වෙළඳාමට තිබූ බාධා වැඩිවීම.

28. ගෝලීයකරණය ශ්‍රී ලංකාවේ ආර්ථිකයට කරන ලද ධනාත්මක බලපෑමක් නොවන්නේ,
(1) ආර්ථික විවිධාංගීකරණය වීම. (2) බුද්ධි ගලනය වේගවත්වීම.
(3) ගෙවුම් ශේෂ තත්ත්වය යහපත්වීම. (4) විදේශ ආයෝජන ගලා ඒම.

29. මැදිහත්කරුවෙකු තෝරා ගැනීමේදී අවධානය යොමු කළ යුත්තේ,
(1) තමාගේ මතය ක්‍රියාත්මක කරන්නෙකු වීම. (2) දෙපාර්ශවයම බලපෑම් කරන්නෙකු වීම.
(3) දෙපාර්ශවයම පිළිගන්නා අයෙකු වීම. (4) පක්ෂපාතී අයෙකු වීම.

30. ගැටුම් සාමකාමීව නිරාකරණය කර ගැනීමේ වාසියක් වන්නේ,
(1) ඉවසීම ප්‍රගුණ කිරීමට හැකි වීමයි. (2) අන් අයගේ ප්‍රසාදයට පාත්‍ර වීමයි.
(3) දරාගැනීමේ ශක්තිය ඇති වීමයි. (4) ජීවිත හා දේපළ හානි වැළකීමයි.

31. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රියාත්මකවන නූතන රාජ්‍යයන් උත්සාහ ගන්නේ,
(1) සංස්කෘතික විවිධතා තුළ ජාතිය ගොඩනැගීමටය. (2) රාජ්‍ය සුබසාධනය වර්ධනය කිරීමටය.
(3) ජාත්‍යන්තර සංවිධාන සමග සංධානගතවීමටය. (4) ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම තහවුරු කිරීමටය.

32. ඒකීය ආණ්ඩු ක්‍රමයකට අදාළ වන ප්‍රකාශය තෝරන්න.
(1) බලය තනි ආණ්ඩුවකට මධ්‍යගතකර ඇත.
(2) මධ්‍යම හා ප්‍රාන්ත වශයෙන් ආණ්ඩු තල දෙකකින් යුක්ත වීම.
(3) ඉන්දියාව හා ශ්‍රී ලංකාව ඒකීය ආණ්ඩු ක්‍රම ක්‍රියාත්මක රටවල්ය.
(4) ව්‍යවස්ථා අර්ථකථනය ඉහළ උසාවියට පවරා තබීම.

33. ඇමරිකාවේ පවතින ප්‍රාන්ත සංඛ්‍යාව,
(1) 30 කි. (2) 40 කි. (3) 50කි. (4) 60කි.

34. ශ්‍රී ලංකාවේ පළාත් සභා පිහිටුවන ලද්දේ කුමන ව්‍යවස්ථා සංශෝධනය පදනම් කරගෙනද ?
(1) 13 (2) 14 (3) 15 (4) 16

35. බහු සංස්කෘතික සමාජයක ජනතාව එක්සත්ව කටයුතු කිරීමෙන්,
(1) ජාතීන් අතර ගැටුම් නිර්මාණය වේ. (2) ජාතීන් අතර ගැටුම් අවම වේ.
(3) ජාතීන් අතර ගැටුම් නැතිම වේ. (4) ජාතීන් අතර ගැටුම් වැඩි වේ.

36. පරිවර්තන ආර්ථිකවල දක්නට ලැබෙන ලක්ෂණයක් වන්නේ,
(1) රාජ්‍ය ව්‍යවසායන් දිරිගැන්වීම. (2) ආර්ථිකයට රාජ්‍ය අංශයේ මැදිහත්වීම.
(3) සහනාධාර ලබාදීම පුළුල් කිරීම. (4) පෞද්ගලික ව්‍යවසායන් දිරිගැන්වීම.

37. ශ්‍රී ලංකාව වර්තමානයේ ණය ආධාර ලබාගන්නා ප්‍රධානතම ජාත්‍යන්තර සංවිධානය වන්නේ,
(1) ලෝක බැංකුව (2) අන්තර් ජාතික මූල්‍ය අරමුදල
(3) ආසියානු සංවර්ධන බැංකුව (4) එක්සත් ජාතීන්ගේ සංවිධානය

38. වර්ෂ 2000 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් පැවැත්වූ සහස්‍රක සමුළුවේදී සම්මතකරගත් සංවර්ධන ඉලක්කයක් නොවන්නේ,
(1) දුප්පත්කම හා සාගින්න තුරන් කිරීම. (2) මානසික සෞඛ්‍ය වර්ධනය කිරීම.
(3) ස්වභාවික ආපදා කළමනාකරණය කිරීම. (4) ළදරු මරණ අනුපාතිකය අඩු කිරීම.

39. සූක්ෂම ගැටුම් වලට නිදසුනක් නොවන්නේ,
(1) ඉඩම් ආරවුල් (2) මතවාදී ගැටම් (3) මානසික ගැටුම් (4) පවුල තුළ ඇතිවන ගැටුම්

40. ජාතීන් අතර සමගිය ඇතිකිරීම සඳහා වඩාත් යෝග්‍ය වන්නේ,
(1) සෑම ආගමක්ම ඇදහීමට පෙළඹීමයි. (2) මිශ්‍ර විවාහ ක්‍රමය නීතිගත කිරීමයි.
(3) එක් භාෂාවක් පමණක් කතා කිරීමයි. (4) අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමයි.

(ලකුණු 1X40 = 40)

**11පත්‍රය**

- පළමු වන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු වන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව **ප්‍රශ්න පහකට** පිළිතුරු සපයන්න.

01.

i. ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රධාන ස්වරූප දෙක ලියන්න.
ii. අතීතයේ පටන් ලෝකයේ විවිධ රාජ්‍යයන් භාවිතා කළ පාලන ක්‍රම දෙකක් ලියන්න.
iii. බලය බෙදා ඇති ආකාරය අනුව රාජ්‍යයන්ගේ ප්‍රධාන ස්වරූප දෙක ලියන්න
iv. ඇමරිකානු ව්‍යවස්ථාදායකය ද්වි මාණ්ඩලිකය. එම මණ්ඩල දෙක නම් කරන්න
v. ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීමට, බලපෑ වෙළඳාම සඳහා පැමිණි විවිධ ජාතීන් දෙපිරිසක් ලියන්න.
vi. මූලික ආර්ථික ප්‍රශ්නවලින් දෙකක් ලියන්න
vii. ආර්ථිකයක සිදුවන ක්‍රියාවලීන් ප්‍රධාන කොටස් තුනකි. ඉන් දෙකක් දක්වන්න.
viii. ගැටුම් ඇතිවන මූල දෙකක් ලියන්න
ix. අන්තර්ජාතික ගැටුම්වල ප්‍රධාන කොටස් දෙක ලියන්න.
x. මැදිහත්කරුවෙකු තුළ පැවතිය යුතු ගුණාංග දෙකක් ලියන්න. (ලකුණු 2x10 = 20)

02. පාලන කටයුතුවලට ජනතාවටද සහභාගී වීමට ඉඩ ලැබෙන පාලන ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයයි.
i. ද්වි පක්ෂ ක්‍රමය ක්‍රියාත්මක රටවල් දෙකක් ලියන්න. (ලකුණු 2)
ii. තරගකාරී පක්ෂ ක්‍රමයක යහපත් ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 3)
iii. a විරුද්ධ පක්ෂයෙන් ඉටුවිය යුතු කාර්යයන් දෙකක් දක්වන්න. (ලකුණු 2)
b ඉන් එක් කාර්යයක් විස්තර කරන්න. (ලකුණු 3)

03. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය වර්තමානයේ ජනප්‍රියම පාලන ක්‍රමය බවට පත්වී ඇත.
i. ජාතික රාජ්‍ය බිහිවීමට බලපෑ හේතු දෙකක් ලියන්න. (ලකුණු 2)
ii. රාජ්‍යයක දක්නට ලැබෙන මූලික ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 3)
iii. a ආණ්ඩුව සමන්විත වන ආයතන තුනෙන් දෙකක් දක්වන්න. (ලකුණු 2)
b ඉන් එක් ආයතනයක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 3)

04. රාජ්‍යයක පාලන කටයුතු පවත්වාගෙන යාම සඳහා රාජ්‍යයට ඇති හැකියාව බලය වේ.
i. බලය විමධ්‍යගත කිරීම යන්න හඳුන්වන්න. (ලකුණු 2)
ii. මහජනතාව සතු පරමාධිපත්‍යය බලයට අයත් වන්නාවූ ක්ෂේත්‍ර තුන ලියන්න. (ලකුණු 3)
iii. a ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක පළාත් පාලන වර්ග දෙකක් ලියන්න. (ලකුණු 2)
b ඉන් එක ආයතනයක ප්‍රධානියා සතු කාර්යයන් විස්තර කරන්න. (ලකුණු 3)

05. නූතන සමාජ බොහොමයක් බහු සංස්කෘතික සමාජ වේ.
i. බහු සංස්කෘතික සමාජයක මූලික ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)
ii. යහපාලනයක දැකිය හැකි මූලික ගුණාංග තුනක් ලියන්න. (ලකුණු 3)
iii. a බහු සංස්කෘතික සමාජයක ඇති විය හැකි ගැටුම් වර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)
b එවැනි ගැටුම් වළක්වා ගැනීමට ඔබට ගතහැකි ක්‍රියාමාර්ග කෙටියෙන් විස්තර තරන්න. (ලකුණු 3)

06. සංවර්ධනය යන්න අතිශය පුළුල් සංකල්පයකි.
i. සංවර්ධනය යන සංකල්පයේදී සලකා බැලිය යුතු අංශවලින් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)
ii. ගෝලීයකරණය තුළ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 3)
iii. a තිරසාර සංවර්ධනයේදී සැලකිය යුතු කරුණු දෙකක් ලියන්න. (ලකුණු 2)
b ඉන් එක් කරුණක් විස්තර කරන්න. (ලකුණු 3)

07. ගැටුම් යනු විවිධත්වයේ ප්‍රතිඵලයකි.
i. මනසේ සාමය ඇති කර ගැනීම සඳහා යොමු විය හැකි අංශ දෙකක් ලියන්න. (ලකුණු 2)
ii. ජොහාං ගැල්ටුන් විසින් ඉදිරිපත්කළ ගැටුම් අරගල ත්‍රිකෝණයේ අවස්ථා තුන ලියන්න. (ලකුණු 3)
iii. a ගැටුම් නිරාකරණයේ දී සාකච්ඡා ක්‍රමයේ ගති ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)
b ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 3)

උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

2023 තෙවන වාරය

**පිළිතුරු පත්‍රය - පුරවැසි අධ්‍යාපනය**

| ? | පිළිතුර | ? | පිළිතුර | ? | පිළිතුර | ? | පිළිතුර |
|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 11 | 1 | 21 | 3 | 31 | 1 |
| 2 | 3 | 12 | 3 | 22 | 2 | 32 | 1 |
| 3 | 4 | 13 | 2 | 23 | 2 | 33 | 3 |
| 4 | 1 | 14 | 4 | 24 | 1 | 34 | 1 |
| 5 | 1 | 15 | 4 | 25 | 4 | 35 | 2 |
| 6 | 3 | 16 | 3 | 26 | 1 | 36 | 4 |
| 7 | 2 | 17 | 1 | 27 | 3 | 37 | 2 |
| 8 | 4 | 18 | 2 | 28 | 2 | 38 | 3 |
| 9 | 2 | 19 | 1 | 29 | 3 | 39 | 2 |
| 10 | 1 | 20 | 4 | 30 | 4 | 40 | 4 |

01.

i. සෘජු ප්‍රජාතන්ත්‍රවාදය, වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය
ii. රාජාණ්ඩු, රදළ ආණ්ඩු, ප්‍රජාතන්ත්‍රවාදී ආණුඩු
iii. ඒකීය , සංධීය
iv. නියෝජිත ම.ම.(ම.ම.ම.) , සෙනෙට් සභාව
v. අරාබි ජාතිකයින්, ඉන්දියානුවන්, චීන ජාතිකයින්, යුරෝපා ජාතිකයින් ( ඉංග්‍රීසි ලන්දේසි හා පෘගීසි යුරෝපා වේ)
vi. කුමක් කොපමණ නිෂ්පාදනය කරන්නේද? , කෙසේ නිෂ්පාදනය කරන්නේද? , කවුරුන් සඳහා නිෂ්පාදනය කරන්නේද?
vii. නිෂ්පාදනය, බෙදාහැරීම, පරිභෝජනය
viii. වාර්ගිකත්වය, දේශපාලනය, ආගමික මතවාද, සමාජ ආර්ථික තත්ත්වය,
ix. මතවාදී ගැටුම්, යුධමය ගැටුම්
x. හොඳ සවන්දෙන්නෙකු වීම, විශ්වාසවන්තභාවය, කැපවීම, අවංකවීම, අපක්ෂපාතීභාවය, මධ්‍යස්ථභාවය, විචාරශීලී හා නිරමාණශීලී බව

02.

i. බ්‍රිතාන්‍ය, ඇමරිකාව
ii. ජනමත නියෝජනයට ඇති ඉඩකඩ පළුල්වීම,/ අත්තනෝමතික පාලන බිහවීම වැළැක්වීම,/ ආණ්ඩුව් අහිතකර ප්‍රතිපත්ති විවේචනය තුළින් නිවැරදි මර්ගයට ගැනීමට හැකිවීම/. ජන සමාජයේවිවිධත්වයන් නියෝජනය කිරීමට හැකවීම,/ බහුවිධතාව තුළින් එක්සත්කම ගොඩනැගීම
iii. ආණ්ඩුවේ යහපත් කටයුතුවලට සහයෝගය ලබාදීම,/ සංවර්ධනාත්මක විවේචන තුළින් ආණ්ඩුව සුමගට යොමරිකිරීම,/ ආණ්ඩුවේ ප්‍රජාතන්ත්‍රවිරෝධී කටයුවලට විරුද්ධවීම /, විකල්ප ආණ්ඩුවක් ලෙස කටයුතු කිරීම

03.

i. රෙපරමාදු ආගමික ප්‍රතිසංස්කරණය, පුනරුදය, වැඩවම් ක්‍රමය බිඳවැටීම හා ධනවදී අර්ථිකයක් ගොඩනැගීම, විද්‍යාත්මක දැනුම වර්ධනය
ii. භූමිය , /ජනගහනය, /ආණ්ඩුව, /ස්වාධිපති බලය
iii. ව්‍යවස්ථාදායකය,/ විධායකය,/ අධිකරණය

04.

i. මධ්‍යම ආණ්ඩුව සතු පරිපාලන බලතල යම් ප්‍රමාණයක් ප්‍රාදේශීය පාලන ඒකක වෙත පවරා දීම බලය විමධ්‍යගත කිරීම ලෙස හැඳින්වේ.
ii. පාලන බලතල,/ ඡන්ද බලය, /මූලික අයිතිවාසිකම්
iii. මහ නගර සභා,/ නගර සභා,/ ප්‍රාදේශීය සභා

05.

i. විවිධ ජනවර්ග ආගම්, භාෂ,විශ්වාස ඇති පුද්ගලයින් ජීවත්වීම/ එම විවිධත්වයන්ට අදාළ සිරිත් විරිත් ආචාර ධර්ම පැවතීම/ එක ජන සමාජයක උවද ප්‍රාදේශීය විවිධත්වයන් පැවතීම/දේශ සීමා අභිභවා ගොස් බහු සංස්කෘතික සමාජ ඇති වීම/ ගෝලීයකරණය/ සන්නිවේදනය/ තාක්ෂණයේ දියුණුව/ සංචාරක ව්‍යාපාරය
ii. දූෂණයෙන් තොර රාජ්‍ය පාලනය/ නිදහස හා සාධාරණත්වය තහවුරු කිරීම /64 පිටුවේ කරුණු 10ක් ඇත.
iii. ආගම් අතර/ ජන වර්ග අතර/ දේශපාලනික/ සංස්කෘතික

06.

i. අර්ථික සං./ පුද්ගල සං./ සංස්කෘතික සං./ සමාජ සං./ සදාචාර සං./ තිරසර සං.
ii. වැඩ ලෝකය පුළුල් වීම/ ගෝලීය වෙළඳපල පුළුල් වීම/ ලෝකයේ ඕනෑම රටක ජීවත්වීමට හැකි වීම/දක්ෂතා හා හැකියා අනුව වෙනත් රටක සේවය කිරීමට හැකිවීම/ අඩු මිලට ශ්‍රමය ලබාගත හැකි රටවලට කර්මාන්ත සංක්‍රමණය වීම
iii. මූලික අවශ්‍යතා තෘප්තිමත්කර ගැනීම/ අනාගත පරම්පරාවත් සමග ඒකමතික වීම/ ජනතා සහභාගීත්වය ඇතිකර ගැනීම/ ස්වභාවික සම්පත් සංරක්ෂණය/ පරිසරය ආරක්ෂා කරගැනීම/ සමාජ සුරක්ෂිතතාවය/ අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම.

07.

i. ආගමික වතාවත්වල නියැලීම/ මනෝ විද්‍යාත්මක අභ්‍යාස/ උපදේශන/ ස්වභාවික පරිසර නිරීක්ෂණ
ii. චර්යාව/ සන්දර්භය/ ආකල්ප
iii. සාකච්ඡාවෙන් විසඳුම් කරා යොමුවීම/ පෞද්ගලික හෝ විශ්වාස මට්ටමෙන් සිවීම/ ත්ෂණික විසඳුම් ලැබීම/ වියදම් අවම ක්‍රමයක් වීම/ අවිධිමත් ව්‍යුහයකින් යුක්ත වීම/ දෙපාරශවයටම ජය ජය විසඳුම් මි

# LOL.lk
## BookStore

# විභාග ඉලක්ක
# පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න





| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**